4 වන පිටෙන්

වැඩ කටයුතු කරන බවත් කියා සිටිය හ.
එබැවින් එම නිලධාරීන් සම්බන්ධයෙන් ඉක්මන් ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙස ඇන්ටන් බාලසිංහම් රජයේ සාම නියෝජිතයන්ගෙන් ඉල්ලා සිටියේ ය.
එම පිරිස අතර මේජර් සමන් වෙදගම මහතා ද සිටියේ ය.
බාලසිංහම්ගේ ඉල්ලීම අකුරට ක්‍රියාත්මක කරමින් මේජර් වෙදගම ඇතුළු ඔත්තු නිලධාරීන් හත් දෙනෙකුම මුළු ඔත්තු අංශයෙන්ම ඉවත් කරනු ලැබුවේ හමුදා ඔත්තු අංශය තවත් දුර්වල තත්ත්වයකට පත් කරවමිනි.
හමුදාපතිවරයාට එල්ල වූ දරුණු ප්‍රහාරයෙන් පැය කිහිපයකට පසු රජයේ ගුවන් හමුදාවේ කෆීර් ප්‍රහාරක යානාවලින් ත්‍රිකුණාමලයේ සාම්පූර් කොටි කඳවුරට රජය මගින් දරුණු ගුවන් ප්‍රහාර කිහිපයක් එල්ල කළේ ය.
ඉන් කොටි කඳවුරු කිහිපයකට බරපතල අලාභහානි සිදුවිය. කොටි 30 කට ආසන්න පිරිසක් මියගොස් තවත් විශාල පිරිසක් තුවාල ලබා ඇත. ඔවුන්ගේ අවි ගබඩාවලට සිදු වී ඇති විනාශය ඉතාම විශාල ය.
ප්‍රහාරයෙන් සාමාන්‍ය වැසියන් 08 දෙනෙක් පමණ මියගොස් ඇත. ඒ අතර පූජකවරයෙක් ද සිටී. නමුත් කොටි 'ටැමිල් නෙට් වෙබ් අඩවිය' හරහා ප්‍රකාශ කළේ සාමාන්‍ය වැසියන් වාසය කරන ගම්මානයකට හමුදාව ප්‍රහාර එල්ල කර ඇති බව ය.
නමුත් එම ප්‍රදේශයේ නිරීක්ෂණ කටයුතුවලට ගිය සටන් විරාම නිරීක්ෂණ කමිටුවේ නිලධාරීන් ප්‍රකාශ කරන්නේ ප්‍රහාර එල්ල කර ඇත්තේ සාමාන්‍ය වැසියන්ට නොව, කොටි කඳවුරුවලට බවය.
බ්‍රිතාන්‍යයේ සිට විකාශනය වන බී.බී.සී. ගුවන් විදුලිය මෙම සිද්ධිය පිළිබඳව වැරදි අර්ථකථනයක් මුළු ලෝකයටම ප්‍රචාරය කළේ රජයේ දැඩි විවේචනය තුළ ය.
බී.බී.සී. ප්‍රකාශ කළේ සාම්පූර් ගුවන් ප්‍රහාරවලින් සාමාන්‍ය වැසියන්ගේ පවුල් 43000 ක් අනාථ වී ඇති බව ය. නමුත් සාම්පූර් ප්‍රාදේශීය ලේකම්වරයා ප්‍රකාශ කරන්නේ එම ප්‍රදේශයේ වාසය කරන සාමාන්‍ය පවුල් සංඛ්‍යාව 16,604 ක් බව ය.
ප්‍රහාරවලින් අසරණ වී ඇත්තේ පවුල් 1100 ක් තරම් සංඛ්‍යාවකි. එමඟින් බී.බී.සී. ප්‍රකාශය අසත්‍යයක් බවට මනාව පසක් වේ.
සාම්පූර් ප්‍රහාරය එල්ල වීමට පැය කිහිපයකට පෙර එම ප්‍රහාර ගැන කල්වේලා ඇතිව කොටි සංවිධානයට ඔත්තු ලැබී ඇත. එය කෙසේ ලැබුණේ ද? යන්න බලවත් ප්‍රශ්නයකි. රජයේ ආරක්ෂක තොරතුරු කොටින්ට සපයන ආරක්ෂක 'හිලක්' රජයේ ආරක්ෂක අංශ ඇතුළේ තිබෙන බව මින් පෙන්නුම් කෙරෙනු ඇත.
එම ඔත්තුව කවුරුන් විසින් කොටින්ට දුන්නේ ද යන්න ආරක්ෂක බුද්ධි බලමණ්ඩලයේ -උකුසු ඇසට" හසුකර ගැනීමට එහි නිලධාරීහු පරීක්ෂණ කරමින් සිටිති.

මෙම සිද්ධිවලට සමගාමීව විවිධ ස්ථානවල තිබී හිස නැති මළ සිරුරු කිහිපයක් ද හමු විය. ඒ අවිස්සාවේල්ල, මුල්ලේරියාව, සෙට්ටිකුලම යනා දී ප්‍රදේශ වලිනි. ඒ සියල්ලම දෙමළ තරුණයන් වන අතර ඔවුනගේ බෙලි කපා මරා දමා තිබිණි.
මෙය කවුරුන් විසින් සිදු කළා ද යන්න ප්‍රශ්නයකි. පොලිස්පති චන්ද්‍රා ප්‍රනාන්දු මහතා කියා සිටින්නේ පාතාල ලෝකයේ දෙපිරිසක් අතර සිදු වූ ගැටුමක ප්‍රතිඵලයක් වශයෙන් ඇති වූ මරණ බව ය. නමුත් එය කොටි හිතවාදී දෙමළ දේශපාලන පක්ෂ ප්‍රතික්ෂේප කර සිටී. ඔවුන් කියන්නේ මෙය හමුදාව විසින් සිදු කර ඇති බව ය. කඳුරට ජනතා පෙරමුණේ නායක පී. චන්ද්‍රසේකරන් මහතා මේ ගැන පසුගියදා සර්ව පාක්ෂික සමුළුවේ දී පවා ප්‍රශ්න කළේ ය. මේ කෙරෙහි ජනාධිපතිවරයා සිය අවධානය යොමු කර වහාම පරීක්ෂණයක් පවත්වන ලෙස පොලිස්පතිවරයාට නියෝග කළේ ය. එහෙත් පැවැත්වෙන පරීක්ෂණයක් පිළිබඳව කිසිවක් දැන ගන්නට නැත.
නමුත් අප කරන ලද සොයා බැලීමක දී අවිස්සාවේල්ලේ තිබූ මළ සිරුරු 05 කට අදාළ බොහෝ තොරතුරු හෙළිදරව් කර ගැනීමට හැකියාව ලැබිණි.
මෙහිදී මිය ගිය එක් අයෙක් වත්තල තෙළඟ පාරේ අංක: 150/3 නිවසේ පදිංචි දෙමළ ජාතිකයෙකු වන මහාලිංගම් නරේන්ද්‍ර කුමාර් ය. ඔහු නුවර ප්‍රදේශයේ ඉපදී හැදී වැඩුණු අයෙකි. කොටි හිතවාදියෙකු වන ඔහු එම සංවිධානයෙන් අවි පුහුණුව පවා ලබාගෙන ඇති බව විශ්වාස කෙරේ.
ඔහුගේ එක කකුලක වෙඩි ප්‍රහාරයකට ලක් වී තුවාලයක් පවා ඇත. මොහු පසුගිය කාල පරිච්ඡේදය තුළ කොටි සමඟ එකතු වී හොර වාහන ජාවාරමේ නියැළුණු අයෙකි. විවිධ ප්‍රදේශවලින් මංකොල්ල කන වාහන වවුනියාවට රැගෙන ගොස් කොටින්ට විකිණීමේ බ්‍රෝකර්වරයෙකු ලෙස ඔහු ක්‍රියා කර ඇත.

තවත් ආරංචි මාර්ගයක් ප්‍රකාශ කර සිටියේ එම තරුණයා ලී වෙළෙඳාමේ යෙදුනු අයෙකු බව ය. එහෙත් එය කොතෙක් දුරට සත්‍යය ද? යන්න සනාථ වී නැත.
මීට අමතරව එහි තිබී හමු වී ඇති තව මළසිරුරක් කොළඹ 12 ආමර් වීදියේ පැරඩයිස් වත්තේ අංක: 12 නිවසේ පදිංචි සිවසාමි සුකුමාර් නමැති දෙමළ තරුණයාගේ ය. ඔහුගේ මස්සිනා නඩරාජා ය. මහාලිංගම් නරේන්ද්‍ර කුමාර්ගේ පියා යෝගේන්ද්‍ර කුමාර් ය. මෙම දෙදෙනා ඇතුළු අවිස්සාවේල්ල රබර් වත්තක බෙලි කපා මරා දමා තිබූ දෙමළ තරුණයන් 05 දෙනාව ආමර් වීදියේ පිහිටි -ඊස්ටන් ලොජ්" එකේ නවාතැන් ගෙන සිටියදී කිසියම් පිරිසක් විසින් පැහැර ගෙන ගොස් මෙලෙස මරා දමා ඇත.
මෙම ඝාතනය සඳහා පී.සී. 7658 අංක දරණ ත්‍රීරෝද රථය උපයෝගී කරගෙන ඇත. එහෙත් එම රථය දැනට තිබෙන ස්ථානයක් පිළිබඳව කිසිඳු තොරතුරක් නැත.
මරණයට පත් වී ඇති පුද්ගයන් සතුව රුපියල් ලක්ෂ ගණනක මුදලක් එම අවස්ථාවේ තිබී ඇත. එම මුදල් ඔවුන් සතුව තිබී ඇත්තේ වාහනයක් මිල දී ගැනීමට බව දැන ගන්නට ඇත.
ඔවුන් ගැන ඔත්තු බලා ආමර්විදී -ඊස්ටන් ලෝජ්" එකේ ඔවුන් නවාතැන් ගත් පසු එතනට කඩා වැදී ඔවුන් සතුව තිබූ මුදල් එම පිරිස විසින් ලබා ගෙන මේ අය මරා දමන්නට ඇතැයි සැක කෙරේ.
පොලිස්පතිවරයා මේ ගැන පරීක්ෂණ ආරම්භ කළ බව ප්‍රකාශ කළත් මීට සම්බන්ධ පුද්ගලයන් අත්අඩංගුවට ගත් බවක් නම්, පෙනෙන්නට නැත.
ඇතැම් අය ප්‍රකාශ කරන්නේ ආරක්ෂක අංශ ආමර් වීදිය ලොජ් එක පරීක්ෂා කිරීමේදී මෙම දෙමළ තරුණයන් සතුව විශාල මුදල් තොගයක් තිබූ බවත්, එය ලබා ගැනීම උදෙසා ඔවුන්ව මරා දමන්නට ඇති බවය.
එහෙත් එය රජයේ ආරක්ෂක අංශය ප්‍රතික්ෂේප කරයි. ඔවුන් කියා සිටින්නේ රජයට මඩ ගැසීම උදෙසා කිසියම් පිරිසක් මෙම ඝාතනය සිදු කරන්නට ඇති බව ය.

ශ්‍රී ලාල් ප්‍රියන්ත

From Page 6

cated not to get provoked into a Black July situation

Long-term strategies include the following ingredients:
(1) Persistent re-education of Tamil people with regard to issues at stake
(2) a genuine desire and commitment for a realistic devolution of power

(3) Provision of infrastructure for increased physical interaction and marketplace interdependence between North and South

(4) Removal of all vestiges of perceived discrimination in thought and action (7)

Encouraging greater social mobility and social sharing between Sinhalese and Tamil people. The latter would imply education reform and social engineering.

This is no doubt a very slow process unlike the resort to military muscle, which is the obvious thing that would appeal to a simple mind. When the Peace Accord was signed, its architect Ranil Wickremasinghe warned the public not to be unduly sanguine. He stated that the road ahead is long and full of obstacles. Perceptive people have already sensed this. In the meantime, the passage of time by itself can result in many possible developments that may serve to weaken the Tiger camp and soften enemy animosity. Wasn't Karuna a positive development that came as a product of Time?

■


නැවුම් පුවත් හරවත් කතා බහ
දෙස් විදෙස් කාලීන සිද්ධීන් මියුරු සංගීතය
ලක් හඬ FM 97
සෑම ඉරිදාවකම
දහවල් 10.00 සිට 12.00 දක්වා
ඔබේ හඬ - ලක් හඬ




Raigam
THE KINGDOM OF RAIGAM®
21 වන සියවසේ දේශීය සමාගම
www.raigam.lk
Sri Lanka
&
E-Techno Enterprises
Australia
රයිගම් නම් කවදත් කොතැනත්
හරිම රසයි!
Wholesale & Customer Service 03-9700 2100
& 03-93703813 Fax: 03-9337 9468
Sole Agents in Australia & New Zealand:
E-Techno Enterprises, PO Box 87, VIC 3039
Email:sales@etechno.com.au